සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 6 - 2019

නම : ............................................ ක්‍රිස්තියානි ධර්මය කාලය : පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

## I කොටස

(1) දෙවියන් වහන්සේ සතරවන දින දී මවන ලද දේවල් වන්නේ,

1. ගස් කොළන් ය.
2. ආකාශ වස්තූන් ය.
3. මිනිසා ය.
4. අහස සහ සාගරය ය.

(2) ශුද්ධ වූ බයිබලය මුලින් ම ලියැවුණේ කුමන භාෂාවෙන් ද?

1. හෙබ්‍රෙව් භාෂාවෙනි.
2. ග්‍රීක භාෂාවෙනි.
3. ලතින් භාෂාවෙනි.
4. ඉංග්‍රීසි භාෂාවෙනි.

(3) ''ආචාරිනි, අපට කරුණා කරන්න.'' කියා ජේසුස් වහන්සේට පවසන ලද්දේ කවුරුන් ද?

1. අංශභාග රෝගියා ය.
2. අතක් පණ නැති මිනිසා ය.
3. කොර මිනිසා ය.
4. ලාදුරු රෝගීන් ය.

(4) ජේසුස් වහන්සේ නැවත නැගිටි බවට සාක්ෂි දැරූ කාන්තාවක් නොවන්නේ,

1. මීරියම් ය.
2. මද්ගලායේ මරියා ය.
3. ජෝවන්නා ය.
4. ජාකොබ්ගේ මව වූ මරියා ය.

(5) ''සාමුවෙල්'' යන නමේ තේරුම වන්නේ,

1. දෙවියන් වහන්සේ අප සමඟයි.
2. දෙවියන් වහන්සේ සිනාසුණේ ය.
3. දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ගත්.
4. දෙවියන් වහන්සේගෙන් කැඳවීම ලද්දේ ය.

● අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර යා කරන්න.

| | A | B |
|---|---|---|
| (6) | මීරියම්ගේ වැඩිමහල් සහෝදරයා වන්නේ, | ස්තේපන් තුමා ය. |
| (7) | මැවිල්ලේ නිර්මාතෘ වන්නේ, | පිලිප් තුමා ය. |
| (8) | සුබාරංචි පණිවිඩය සමාරිය කරා ගෙන යාමට දායක වූ පුද්ගලයෙකි. | දෙවියන් වහන්සේ ය. |
| (9) | ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව ගෝලයන්ට ඉගැන්වූයේ, | ආරොන් තුමා ය. |
| (10) | උපස්ථායකයින් අතර මූලිකයා වන්නේ, | ජේසුස් වහන්සේ ය. |

● අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(11) ශුද්ධ බයිබලයේ ප්‍රධාන කතෘ දෙවියන් වහන්සේ ය. ( )

(12) සාමුවෙල්ගේ දෙමව්පියන් වන්නේ, ආබ්‍රාහම් හා සාරා ය. ( )

(13) දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාවය පිළිඹිඹු කරන පණත් ගණන හයකි. ( )

(14) කිතුනු අප සතු ප්‍රබල අවිය යාච්ඤාවයි. ( )

(15) නාසරෙත් හි පළමු දේශනයට ජේසුස් වහන්සේ තෝරා ගත්තේ දිවැසිවර යෙසායාගේ පොත ය. ( )

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(ලෙවී, ක්‍රියා, ඒලි, පේදුරු, මතෙව්)

(16) නව ගිවිසුමේ සඳහන් ඉතිහාස පොත වන්නේ .............................. පොතයි.

(17) ශුද්ධ වූ බයිබලයේ සඳහන් පළමු සුබාරංචිය වන්නේ .............................. සුබාරංචියයි.

(18) ජේසුස් වහන්සේගේ ප්‍රධානත ම ශ්‍රාවකයා .............................. තුමා ය.

(19) ''අම්රම් හා ජොකෙබෙද්'' අයත් වන්නේ, .............................. ගෝත්‍රයට යි.

(20) සාමුවෙල්ට දේව පණිවිඩය පහදා දුන්නේ .............................. පූජක තුමා ය.

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු සපයන්න.

(i) දස පණත බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් 2ක් ලියන්න.
(ii) පැරණි ගිවිසුමේ මුල් පොත් පහ හැඳින්වීමට භාවිත කරන නමක් ලියන්න.
(iii) ගොලියත් පරාජය කළේ කවු ද?
(iv) මෝසෙස් බේරා ගැනිමට දායක වූ සහෝදරිය නම් කරන්න.
(v) කමාව පිළිබඳ ස්වාමීන්ගේ යාච්ඤාවේ සඳහන් වන්නේ කුමක් ද?
(vi) ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබුවේ කුමන ස්ථානයේ ද?
(vii) ජේසුස් වහන්සේ කිතුණු අපව සමාන කළ දේවල් 2ක් ලියන්න.
(viii) තම පව් ගැන පසුතැවිලි වී කරන යාච්ඤාව දෙවිදුන් පිළිගන්නා සේක. මෙය ගෙනහැර දැක්වීමට ජේසුස් වහන්සේ දැක් වූ උපමාව කුමක් ද?
(ix) මාගේ අසල්වැසියා කවුදැයි ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කළේ කවු ද?
(x). ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබුවේ කාගෙන් ද? කොහේ දී ද?

(ලකුණු 2 × 10 = 20)

(2) 1. දෙවියන් වහන්සේ ඒදන් උයන මවා භාර දුන්නේ කාට ද? (ලකුණු 2)
2. දේව දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග 3ක් ලියන්න. (ලකුණු 3)
3. දේව මැවිල්ල ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් 5ක් ලියන්න. (ලකුණු 5)

(3) 1. දෙවිදුන්ට සේවය කරන සුබ ආරංචි ගෙනෙන දූතයා නම් කරන්න. (ලකුණු 2)
2. කිතු උපත මුලින් ම දැනුම් දුන්නේ කාට ද? ඊට ඔවුන් දැක් වූ ප්‍රතිචාරය කුමක් ද? (ලකුණු 3)
3. එළඹෙන නත්තල අර්ථවත්ව ගත කිරීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් 5ක් ලියන්න. (ලකුණු 5)

(4) 1. ''මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවේ'' යැයි ක්‍රිස්තුස් වහන්සේ පිළිතුරු දුන්නේ යක්ෂයා ගෙනා කුමන පරීක්ෂාවේ දී ද? (ල. 2)
2. යක්ෂයා ජේසුස් වහන්සේට ගෙනා ඉතිරි පරීක්ෂා දෙක හා ඊට දුන් පිළිතුරු ලියන්න. (ල. 3)
3. ඔබට පැමිණෙන පරීක්ෂා 3ක් ලියා ඉන් එකක් ජය ගැනීමට ඔබ කරන දේ ලියන්න. (ලකුණු 5)

(5) 1. ලාදුරු රෝගීන් දස දෙනාගේ කථාවෙන් ඉගැන් වූ පාඩම කුමක් ද? (ලකුණු 2)
2. එම කතා පුවත ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 3)
3. රෝගීව සිටින ඔබේ මිතුරෙකුට/ මිතුරියෙකුට සුවය පතා යාච්ඤාවක් ලියන්න. (ලකුණු 5)

(6) 1. හන්නා පිරිමි දරුවෙකු ඉල්ලා කළ යැදුමේ දී දෙවියන් වහන්සේ ඉදිරියේ දුන් පොරොන්දුව කුමක් ද? (ල. 2)
2. සමිඳාණන් වහන්සේ සාමුවෙල්ට කථා කරන බව දැනගත් පූජකතුමා සාමුවෙල්ට දීමට කී පිළිතුර කුමක් ද? (ලකුණු 3)
3. සාමුවෙල්ට ලැබූ දේව කැඳවීම තුළ අපට ගෙනෙන ආදර්ශ තුනක් ලියන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Ans

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

### ක්‍රිස්තියානි ධර්මය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) 2 | (2) 1 | (3) 4 | (4) 1 |
| (5) 3 | (6) 4 (ආරොන්තුමා) | (7) 3 | (8) 2 (පිලිප්තුමා) |
| (9) 5 (ජේසුස් වහන්සේ) | (10) 1 (ස්තේපන්තුමා) | (11) ✓ | (12) ✘ |
| (13) ✘ | (14) ✓ | (15) ✓ | (16) ක්‍රියා |
| (17) මතෙව් | (18) පේදුරු | (19) ලෙවී | (20) ඒලි |

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

(1) (i) දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාවය
මිනිසා හා මිනිසා අතර සම්බන්ධතාවය
(ii) නීති පොත්, පංච පුස්තකය
(iii) දාවිත් ය
(iv) මීරියම් ය
(v) අපට වරද කළ අයට අප කමා කරන්නාක් මෙන් අපගේ වරදට කමාවුව මැනව. (මතෙව් 6 /12)
(vi) ගොල්ගොතා හෙවත් කපාලපිටියේ දී ය
(vii) ලුණු හා ආලෝකය
(viii) පරිසියා හා අයකැමියාගේ උපමාව
(ix) විනධරයා
(x) ස්නාවක ජොහන්, ජෝර්දාන් ගඟේ දී ය.

(ලකුණු 2 × 10 = 20)

(2) 1. මිනිසාට (ආදම් හා ඒවට) (ලකුණු. 2)
2. දයාව, ඉවසීම, කමාව, එකමුතුකම ..... ආදී පිළිතුරු (ලකුණු 3)
3. පැළ සිටුවීම, වතුර දැමීම, පොහොර දැමීම.... ආදී පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(3) 1. ගාබ්‍රියල් දේවදූතයා (ලකුණු 2)
2. එඬේරුන්ට - පණිවිඩය ලද විගස බෙත්ලෙහෙමට ගොස් බිළිඳු ජේසුස් වහන්සේව නමස්කාර කිරීම. (ලකුණු 3)
3. අසරණ අයට ආහර වේලක් ලබා දීම, දිව්‍ය පූජාවට භක්තිමත්ව සහභාගි වීම, වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීම.... වැනි ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(4) 1. පළමු පරීක්ෂාව - ඔබ දේව පුත්‍රයා නම් මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනව (ලුක් 4/3) (ලකුණු 2)

2. දෙවන පරීක්ෂාව - යක්ෂයාට නමස්කාර කිරීම. (ලූක් 4/5-7)

පිළිතුර :- නුඹේ දෙවිවන ස්වාමීන් වහන්සේට පමණක් සේවය කරව. (ලූක් 4/8)

තෙවන පරීක්ෂාව - ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න..... (ලූක් 2/9-12)

පිළිතුර :- නුඹේ දෙවිවන ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරව (ලූක් 4/12) (ලකුණු. 3)

3. දිව්‍ය පූජාවට සහභාගි නොවීම, යාච්ඤා කිරීමට ගීතිකා ගායනයට කම්මැලි වීම, නරක ක්‍රියාවලට යොමු වීම..... වැනි ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(5) 1. තුති පිදීමේ වැදගත්කම (ලකුණු 2)

2. ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

3. යාච්ඤාව සලකා ලකුණු දෙන්න. (ලකුණු 5)

(6) 1. තම දරුවා දේව සේවයට කැපකරන බව (ලකුණු 2)

2. ''සමිදානන් වහන්ස, කථා කළ මැනව, ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටිනවා.''

(ලකුණු 3)

3. පිටු අංක 98 අනුව සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)